# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 2076/17 - 2018 ජුනි මස 20 වැනි බදාදා - 2018.06.20

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

# IV (ආ) වැනි කොටස - පළාත් පාලනය

## පළාත් පාලන ආයතන ඡන්ද විමසීම් ආඥාපනත යටතේ දැන්වීම්

**(262 අධිකාරය) පළාත් පාලන ආයතන ඡන්ද විමසීම් ආඥාපනතේ 66අ (1) (අ) වගන්තිය යටතේ මහරගම නගර සභාවේ සභික ධුරයේ පුරප්පාඩුවක් පිරවීම**

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවෙන් නියම කොට ඇති පරිදි නියමිත කාලය තුළ දී දිවුරුම හෝ ප්‍රතිඥාව අත්සන් නොකිරීම හේතු කොටගෙන මහරගම නගර සභාවේ සභික ධුරයක් පුරප්පාඩු වී ඇති හෙයින්ද;

ඉහත කී ආඥාපනතේ 66අ (1) (අ) වගන්තිය යටතේ මහරගම නගර සභාවේ අංක 05 - උඩහමුල්ල කොට්ඨාසයට තේරී පත් වූ ගල්කන්ද ආරච්චිගේ සිසිර අයත් වන්නා වූ අංක 02 දරන ස්වාධීන කණ්ඩායමේ නායකයාට දින තිහ (30) ක කාල පරිච්ඡේදය ඇතුළත පළාත් පාලන ආයතන ඡන්ද විමසීම් ආඥා පනතේ (262 අධිකාරය) 9 වගන්තිය යටතේ නුසුදුස්සෙකු වී නොමැති අපේක්ෂකයෙකු, සභිකයෙකු වශයෙන් තෝරා පත්කර ගනු ලැබිය යුතු යැයි ප්‍රකාශ කරනු ලැබිය යුතු වුද, එම ස්වාධීන කණ්ඩායමට අයත් වන්නාවූ ද, එම මහරගම නගර සභාවේ අංක 05 උඩහමුල්ල කොට්ඨාසයේ සභිකයා පිළිබඳව තීරණය කිරීමට මා විසින් නියම කරනු ලැබ ඇති හෙයින්ද;

ඉහත කී ස්වාධීන කණ්ඩායම් අංක 02 හි කණ්ඩායම් නායක විසින් එම පුරප්පාඩුව පිරවීම සඳහා සරත් අබේගුණවර්ධන නම් කිරීමේ ස්වකීය තීරණය දන්වනු ලැබ ඇති හෙයින්ද ;

මහරගම නගර සභාවේ තේරීම්භාර නිලධාරී සුදු දේවගේ ශානික අනුරුද්ධ රූපසිංහ වන මම, පළාත් පාලන ආයතන ඡන්ද විමසීම් ආඥාපනතේ (262 අධිකාරය) 66අ (1) (අ) වගන්තිය ප්‍රකාර ක්‍රියා කරමින් සරත් අබේගුණවර්ධන, මහරගම නගර සභාවේ අංක 05 උඩහමුල්ල කොට්ඨාසයේ සභිකයා වශයෙන් තෝරා පත් කරගත් බව මෙයින් දැන් ප්‍රකාශ කරමි.

එස්. ඩී. එස්. ඒ. රූපසිංහ,<br>
තේරීම්භාර නිලධාරී,<br>
මහරගම නගර සභාව.

2018 ජුනි මස 19 වැනි දින,<br>
දිස්ත්‍රික් මැතිවරණ කාර්යාලය,<br>
කොළඹ.

07-92